# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර - 2022

## දිලික්ත නීතිය
(පැ තුනයි )

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. කුමාර වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පියෙකු (MLT) ලෙස TM Tech සමාගමේ සේවය කළේය. වසර කිහිපයක් මෙම ආයතනයේ සේවය කිරීමෙන් පසු දිගින් දිගටම ඇතිවූ හුස්ම ගැනීමේ අපහසුතා පිළිබඳව පැමිණිලි කර අතර ඔහුගේ තත්වය උත්සන්න වීම හේතුවෙන් ඔහුව රෝහල්ගත කළේය. තමන් සේවයේ යෙදෙන වෛද්‍ය රසායනාගාරය රසායනික ආරක්ෂණ ඇඳුමක් ඇතුළු ආරක්ෂක උපකරණ සපයා නොමැති බවත් සියලුම කාර්මික ශිල්පීන් සහ සහයකයින් අනතුරුදායක පරිසරයක සේවය කරන බවත් වෛද්‍ය පරීක්ෂණයේදී කුමාර වෛද්‍යවරුන්ට දැනුම් දුන්නේය. තවද, ඔවුන්ට ආරක්ෂිත මුඛ ආවරණ ලබා දී නොමැති අතර, ඔවුන් රසායනාගාරය අවට ප්‍රදේශයේ රසායනික ද්‍රව්‍ය මිශ්‍ර දූෂිත වාතය ආශ්වාස කරන බවත් හෙළි විය. කෙසේ වෙතත්, වෛද්‍යවරුන් ඔවුන්ගේ රෝග විනිශ්චයේදී කුමාරට දිගුකාලීන දුම්කොළ පානය කිරීමේ ඉතිහාසයක් ඇති බවත්, කුමාරගේ පෙනහළු වල ජානමය තත්ත්වයක් හේතුවෙන් දූෂිත වාතය ඔහුගේ පෙණහලුවල පූර්ව පිළිකා සෛල තවත් උග්‍ර කර ඇති බවත් සොයා ගන්නා ලදී. රෝග විනිශ්චය කර මාස කිහිපයකට පසු කුමාර පෙනහළු පිළිකාවක් හේතුවෙන් වයස අවුරුදු 37 දී මිය ගියේය.

කුමාරගේ 29 හැවිරිදි වැන්දඹුව වන දිලානි සිද්ධිය සම්බන්ධයෙන් TM Tech සමාගමෙන් වන්දි ඉල්ලා නඩු පැවරීමට අදහස් කරයි.

කුමාරගේ 67 හැවිරිදි මව වන නිලානි තම එකම පුත්‍රයාගේ මරණය පිළිබඳව දැනගැනීමෙන් ස්නායු කම්පනයට පත් වූ අතර ඇය මේ වන විට පෞද්ගලික රෝහලක ප්‍රතිකාර ලබමින් සිටී. සිදු වූ හානිය සම්බන්ධයෙන් ඇය TM Tech සමාගමට විරුද්ධව නඩු පැවරීමට අදහස් කරයි.

අදාළ දිලික්ත (Delict) හෝ තෝරත (Tort) මූලධර්ම සහ නඩු තීන්දු ඇසුරෙන් දිලානිට සහ නිලානිට උපදෙස් දෙන්න.

02. 'දූරස්ථභාවය පිළිබඳ නෛතික පරීක්ෂණය අවධානය යොමු කරන්නේ සිදු වූ හානිය පුරෝකථනය කිරීමට ඇති හැකියාව හෝ හානිය අපේක්ෂා කළ හැකි ස්වභාවයේ අනතුරකින් සිදු වූ වර්ගයේ වන හානියක් ද යන්නයි. *novus actus interveniens* යන සංකල්පයද ක්‍රියාකාරී හේතුව පිළිබඳ විශ්ලේෂණයටද අදාළ වන තවත් කරුණකි.'

-Lord Hodge and Lord Sales, *Khan v. Meadows* [2021] UKSC 21, 56 ඡේදය

ඉහත ප්‍රකාශය ඇසුරෙන් නෛතික කාරනත්වය හෝ හානියේ දූරස්ථභාවය පිළිබඳ රීති මඟින් පැමිණිලිකරුවෙකුට ඔහුට/ඇයට සිදුවී ඇති හානිය සඳහා වන්දි ලබා ගැනීම සීමා කරන්නේද යන්න විවේචනාත්මකව තක්සේරු කරන්න. ඔබේ පිළිතුර ඔබ තෝරා ගන්නා එක් අධිකරණ බල ප්‍රදේශයක සංසන්දනාත්මක විශ්ලේෂණයකින් සාධනය විය යුතුය.

03. සුනිමල්, පිට්බුල් (Pitbull) සුනඛ අභිජනනය සහ පුහුණු කිරීමේ ව්‍යාපාරයේ නියැලෙන B සමාගමේ අසල්වැසි ඉඩම් හිමියා විය. තම ස්වාමියා හැර අන් අය කෙරෙහි දරුණු ලෙස හැසිරෙන පරිපූර්ණ මුර බල්ලන් බිහි කිරීමට B සමාගම සුනඛයින්ට ඉතා දැඩි පුහුණුවක් ලබා දෙයි. ඔවුන්ගේ දරුණුතම සුනඛයා වන Staff දිනක් උගේ කූඩුවෙන් මිදී සුනිමල්ගේ ඉඩමට පැන ඔහුගේ පුතා වන නිමල්ව සපා කෑවේය. Staff හට අවශ්‍ය එන්නත් ලබා දී ඇති බැවින් සහ සපා කෑම සමේ මතුපිටට පමණක් සීමා වූ බැවින් නිමල්ට සිදුවූ හානිය අවම විය. කෙසේ වෙතත්, Staff උගේ කූඩුවෙන් මිදී සුනිමල්ගේ ඉඩමට තවත් දෙවරක් ඇතුළු වූ අතර, එය තවදුරටත් ඉවසා සිටිය නොහැකි හෙයින් සුනිමල් තම ප්‍රදේශයේ දිසා අධිකරණයේ නඩුවක් ගොණු කිරීමට තීරණය කළේය.

Ryland v. Fletcher රීතිය හෝ කරදරය (nuisance) හෝ ඒ දෙකම යටතේ B සමාගමට එරෙහිව දිස්ත්‍රික් අධිකරණයේ නඩු පැවරිය යුතුද යන්න පිළිබඳව සුනිමල් ව්‍යාකූල වී ඇති අතර එය තවදුරටත් නිරවුල් කරගැනීම පිණිස ඔබේ සහය පතයි.

සුනිමල්ට උපදෙස් දෙන්න.

04. සඳුන් මහතා සහ ලවිනි මහත්මිය පෙර විවාහකව සිටි යුවළකි. ඔවුන්ට හෙන්රි නම් පුතෙකුද සිටී. ඔවුන් දෙපළ ශ්‍රී ලංකාව තුල හඳුනන ප්‍රසිද්ධ රංගන ශිල්පීන් වූහ. විශේෂයෙන් සඳුන් මහතා ඔහුගේ බිරිඳට වඩා වැඩි කීර්තියක් දිනා තිබුණි. විවාහයෙන් වසර විසිදෙකකට පසු, ලවිනි මහත්මිය සඳුන් මහතාට එරෙහිව දික්කසාද නඩු පවරන ලද්දේ ඔහු ගෘහස්ථ අපයෝජකයෙකු බව පවසමිනි. කෙසේ වෙතත්, අධිකරණය ඉදිරියේ පැවසූ දේට අමතරව ලවිනි මහත්මිය 'ශ්‍රීදීප' පුවත්පතට ලිපියක් ලියමින් "සඳුන් යනු ඇයව දිගින් දිගටම මානසික හා ශාරීරික අපයෝජනයට ලක් කළ ජරා බේබද්දෙකු" බව පැවසීය. අධිකරණ

ක්‍රියාපටිපාටිය තුලදී සඳුන් මහතා තමාට එරෙහිව එල්ල වූ සියලු චෝදනා තරයේ ප්‍රතික්ෂේප කළේය. ඔහු තව දුරටත් ප්‍රකාශ කර සිටියේ ලවිනි මහත්මිය විවිධ අවස්ථාවල තමන්ට ද්‍රෝහීව හැසිරුණු බවයි.

කොළඹ දිසා අධිකරණයේ අපහාස නඩු දෙකක් පවරා ඇත. සඳුන් මහතා පිළිබඳව ලවිනි මහත්මිය අධිකරණය ඉදිරියේ පැවසූ දේ සහ පුවත්පතේ පළ කළ අදහස් සම්බන්ධයෙන් සඳුන් මහතා ඇයට එරෙහිව අපහාස නඩුවක් පවරා ඇත. තමාගේ මව අවිශ්වාසවන්ත බව ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් හෙන්රි විසින් සඳුන් මහතාට එරෙහිව දෙවන නඩුව පවරා ඇත.

මෙම සිද්ධීන් ඔස්සේ ගෙන එන නඩුකර *actio injuriarum* යටතේ අපහාස (defamation) සඳහා වන නඩුකර සාර්ථක වන්නේද යන්න විශ්ලේෂණය කරන්න.

05. ජ්‍යෙෂ්ඨ නාවික නිලධාරියෙකු වන පිනුම් මහතා සති අන්තයේ රාජකාරියෙන් නිවාඩු ලබා සිටියදී ඔහුගේ මිතුරන් පිරිසක් සමඟ ප්‍රාදේශීය භෝජනශාලාවකට ගියේය. මත්පැන් පානය කිරීමෙන් පසු පිනුම් මහතා සහ ඔහුගේ මිතුරන් දිය නෑමට තීරණය කළහ. ඔවුන් Seagull Breeze නම් අසල පිහිටි වෙරළබඩ අවන්හලකට ඇවිද ගිය නමුත් එය රාත්‍රිය සඳහා වසා තිබුණි. තමා අවන්හලේ කළමනාකරු හඳුනන බැවින් ඔවුන්ට තවමත් අවන්හල සතු තොටුපළට යා හැකි බව පිනුම් මහතා කියා සිටියේය. ඔවුහු අවන්හල වටා තිබූ පහත් වැටෙන් පැන තොටුපළ දිගේ මුහුදට ගියහ. එම ස්ථානය ඉතාමත් අඳුරු වූ අතර කණ්ඩායමේ එක් සාමාජිකයෙකු වන ගුල්ලා මහතා අඳුරේ මුහුදට කිමිදීමට ඇති තම අකමැත්ත දැක්වීය. කෙසේ වෙතත්, පිනුම් මහතා නැවතත් තහවුරු කොට සිටියේ ඔහු මෙම අවන්හලෙන් දිවා ආහාරය ගැනීමෙන් පසු දිය නෑමට නිතර එන ස්ථානයක් බවයි. තම මතය සනාථ කිරීම සඳහා පිනුම් මහතා තොටුපළෙන් පැන දියේ කිමිදුණි. අවාසනාවන්ත ලෙස වඩදිය බැස තිබුණු නිසා Seagull Breeze විසින් ඉදිකරන ලද මුහුදු පවුරේ කොටසක පිනුම් මහතාගේ හිස ගැටීමෙන් ඔහුගේ කොඳු ඇට පෙළ කැඩී, සදාකාලික අංශභාගය ඇති විය.

තමා හට සිදු වූ හානිය සම්බන්ධයෙන් Seagull Breeze අවන්හලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පිනුම් මහතා අදහස් කරයි. කළමනාකාරිත්වය මෙ සම්බන්දයෙන් වරදකාරිත්වය ප්‍රතික්ෂේප කරන අතර වඩදිය බාදිය වැඩි වන දිවා කාලයේ මෙම තොටුපළෙන් කිමිදීම ආරක්ෂිත බවත් සාමාන්‍යයෙන් අවන්හල විවෘතව ඇති විට ඔවුන් තොටුපළේ ආරක්ෂක නිලධාරියෙකු ස්ථානගත කර ඇති බවත් තර්ක කරයි.

ඉහත සිද්ධි දාමය විශ්ලේෂණය කොට පාර්ශවයන්ගේ වගකීම තීරණය කරන්න. අදාළ නීති අධිකාරීන් සමඟින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

06. නන්දිමිත්‍ර සහ සුරනිමල යන දෙපල විශාල තොග වෙළඳසැලක් වන Badu-Muttu (Pvt) Ltd හි ගබඩාවේ භාණ්ඩ පැටවීම සහ බෑම සඳහා යොදවා ඇත. එක් උදෑසනක ඔවුන් සහල් විශාල ප්‍රමාණයක් මිලදී ගැනීමට පැමිණි ගමේ මුදලාලි කෙනෙක් වූ ඩඩ්ලි මහතා හමුවිය. අවශ්‍ය හාල් ගෝනිය උස් රාක්කයක තිබූ අතර සාමාන්‍යයෙන් ගබඩා කාර්ය මණ්ඩලය එය ලබා ගැනීම සඳහා ෆෝරක්ලිෆ්ට් (forlklift) යන්ත්‍රයක් භාවිතා කළහ. ෆෝක්ලිෆ්ට් යන්ත්‍රය දැනටමත් භාවිතයේ තිබූ බැවින්, නන්දිමිත්‍ර සහ සුරනිමල රාක්කයට නැඟ තනිවම හාල් ගෝනිය ලබා ගැනීමට තීරණය කළහ. මෙය ඔවුන් මීට පෙර අවස්ථාවකද සිදු කළ දෙයක් නමුත් ඔවුන්ගේ සේවායෝජකයා ඔවුන්ට එසේ කිරීම තහනම් කර ඇත. නන්දිමිත්‍ර හාල් ගෝනිය අල්ලා ගැනීමට රාක්කයේ අසල බලා සිටියදී සුරනිමල රාක්කයට නැග්ගේය. අවාසනාවකට මෙන් සුරනිමලගේ අතින් ගෝනිය ගිලිහී රාක්කයේ අනෙක් කෙළවරෙහි සිටි තවත් පාරිභෝගිකයෙකු වූ අතපත්තු මහතා මතට වැටුණු අතර ඔහු බිම ඇද වැටී අත බිඳුණි.

ගෝනියේ තිබූ සහල් බිම පුරා විසිරී ගිය නිසා නන්දිමිත්‍ර සතියකට දින තුනක් BaduMuttu හි සේවයේ යෙදෙන පිරිසිදු කරන්නිය වූ පවිත්‍රාට කතා කළේය. BaduMuttu ඇයට සමාගමේ නිල ඇඳුම ඇඳීම අනිවාර්ය කර ඇති අතර ඇය වැඩ කරන අතරතුර පාරිභෝගිකයන්ට ආචාරශීලී වන ලෙසද උපදෙස් දී ඇත. පවිත්‍රා BaduMuttu හි සේවය නොකරන දිනයන්හි තවත් වෙළඳසැල් කිහිපයකද සේවයේ යෙදේ. ඇය සතුව පිරිසිදු කිරීමට භාවිතා කරන උපකරණ සහිත කරත්තයක් ඇති අතර එය ඇයට තම රැකියාව කිරීම සඳහා BaduMuttu විසින් ලබා දී ඇත. නන්දිමිත්‍රගෙන් ඇමතුම ලැබුණු විගස ඇය ඉක්මනින් කරත්තය අනතුර සිදුවූ ස්ථානය දෙසට ගෙන ගියාය. ඇය ඉතා වේගයෙන් කරත්තය තල්ලු කරමින් සිටි අතර නොසැලකිලිමත් ලෙස පද්මිණී මහත්මියගේ පාදය කිඳීමට ලක් කරමින් ඒ මතින් දිව ගියාය.

Badu-Muttu (Pvt) Ltd හි අභ්‍යන්තර නීති උපදේශකයෙකු ලෙස, අදාළ නීති බලධාරීන් උපුටා දක්වමින් Badu-Muttu (Pvt) Ltd විසින් අතපත්තු මහතා සහ පද්මිණී මහත්මිය කෙරෙහි ඇති වගකීම පිළිබඳව කළමනාකාරීත්වයට උපදෙස් දෙන්න.

(සෑම ප්‍රශ්නයක්ම 100 න් ලකුණු කරනු ලැබේ)

*****